# විශේෂ නිවේදනයයි.

## මගී ජනතාවගේ දැන ගැනීම පිණිසයි.

1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 18 වන වගන්ති ප්‍රකාරව අන්තර් පළාත් මගී ප්‍රවාහනය සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ බලධාරියා වනුයේ ජාතික ගමනාගමන කොමිෂන් සභාව වේ. ඒ අනුව ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ බලපත්‍ර නොලබා අන්තර් පළාත් මාර්ගවල බස්රථ ධාවනය නොකළ යුතුය.

මගී සේවා බලපත්‍ර නොමැතිව බස්රථ කිහිපයක් යාපනය - කොළඹ සේවාව ඇතුළුව අන්තර් පළාත් මාර්ග කිහිපයක ධාවනය වන බවට තොරතුරු ලැබී ඇත. ඒ අනුව දැනට එම බස්රථ සම්බන්ධ ක්‍රියාමාර්ග ගැනීම ජාතික ගමනාගමන කොමිෂන් සභාව සමඟ අනිකුත් නියමිත ආයතන මගින් ක්‍රියාත්මක කරනු ලබයි.

නියමිත වලංගු මගීසේවා බලපත්‍රයක් නොමැති බස්රථයකින් ගමන් කිරීමේදී මගී ජනතාවට අපහසුතා ඇතිවිය හැකි නිසා මේ පිළිබඳව ඉතාමත් සැලකිලිමත් වන ලෙස මගී ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

මගී සේවා බලපත්‍ර හෝ වෙනත් ගැටළු සම්බන්ධව විස්තර ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ක්ෂණික ඇමතුම් අංක 1955 ඇමතීමෙන් ලබාගත හැකිය.


සභාපති
ජාතික ගමනාගමන කොමිෂන් සභාව.

දුරකථන අංකය: **2587372**

ඊ - මේල් **info@ntc.gov.lk**
වෙබ් අඩවිය **www.ntc.gov.lk**